# 22

# සීරතුර් රසූල් 02

## නබිතුමාගේ මක්කා ජීවිතය වහී ප්‍රධානය හා ප්‍රචාරය

පෙර පාඩමේ දී නබි (සල්) තුමාගේ උපත, තරුණ වියේ ආදර්ශයන් අධ්‍යයනය කළ අප මෙහි දී නබි (සල්) තුමාට වහී ප්‍රදානය වූ ඉතිහාසයත් ප්‍රචාරයත් පිළිබඳ ව දැන ගනිමු.

නබි (සල්) තුමා තම 40 වන විය ආසන්න වෙත් ම තම සමාජයේ තත්ත්වය දැක දැඩි ලෙස කණගාටු විය. සමාජය ප්‍රතිසංස්කරණය කිරීම සඳහා දැඩි ලෙස සිතන්නට විය. තනිව සිටීම ප්‍රිය කළ එතුමා ඒ සඳහා කඃබාවේ සිට සැ. 3ක දුරින් පිහිටි හිරා ගුහාවට ගියේ ය. එහි තනිව සිට අල්ලාහ් පිළිබඳ සිතුවිල්ලේ නිරත විය.

මෙලෙස වසර 3ක් ගතවිය. නබි (සල්) තුමාණන්ට යහපත් සිහින පෙනෙන්නට පටන් ගත්තේ ය. අනතුරු ව රමලානයේ එක් දිනක් රාත්‍රියේ හිරා ගුහාවේ සිටින විට ජිබ්රීල් (අලෛ) තුමා එතුමා ඉදිරියේ දිස් විය. ''ඉක්රඃ '' පාරායනය කරනු යනුවෙන් පැවසීය.

පාරායනය කිරීමට තමන් නොදන්නා බව නබි (සල්) තුමාණෝ පිළිතුරු දුන්හ. එවිට ජිබ්රීල් (අලෛ) තෙවතාවක් එතුමා ව වැළඳ ගෙන පාරායනයට යොමු කළේ ය. තමන් පාරායනය කිරීමට නොදත් බව එවිට ද පැවසීය. තෙවන වතාවේ දී සූරා අලක් හි මුල් ආයත් පහ ජිබ්රීල් (අලෛ) විසින් පාරායනය කරනු ලැබී ය. නබිතුමාණන් විසින් එය වනපොත් කරන ලදි. මෙය නබිතුමාට ප්‍රදානය වූ පළමු වහී ය වේ.

මෙම සිද්ධියෙන් නබි (සල්) තුමා තැති ගත්තේ ය. වෙවුළමින් නිවසට වේගයෙන් ගියේ ය. තමාව පොරවන මෙන් බිරිඳ කදීජා ගෙන් අයැද සිටියහ. බිරිඳ වූ කදීජා (රලි) තුමිය විසින් නබි (සල්) තුමාව පොරවා සනසන ලදි. හිරාවේ සිදු වූ දේ විමසුවා ය. තමාගේ ඥාතියෙකු ද, ආගම් පිළිබඳ විශාරදයෙකු ද වන වරකත්



ඉබ්නු නව්ෆල් වෙත එතුමා කැඳවා ගෙන ගියා ය. සිදු වූ සියල්ල ඔහුට විස්තර කළා ය. එයට සවන් දුන් වරකත් ඉබ්නු නව්ෆල් මුහම්මද් තුමාට නුබුව්වත් හෙවත් නබිත්වය ලැබී ඇති බවත්, නබි තුමා වෙතට පැමිණියේ ජිබ්රීල් (අලෛ) බවත්, පෙර නබිවරුන්ට ශුභාරංචි ගෙනා මලාඉකාවරයා බවත් විස්තර කළේ ය. මෙය ඇසූ කදීජා (රලි) තුමිය මුහම්මද් (සල්) තුමාණන් ව නබිවරයෙකු ලෙස පිළිගත්තාය.

## නබිතුමාගේ ප්‍රචාරය

නබි (සල්) තුමාණන් වහී ප්‍රදානය වීමත් සමග ම එය ප්‍රචාරය කිරීමට අණ ලැබුණි. අනතුරුව එතුමා තම ප්‍රචාරය ආරම්භ කළේ ය. මුලදී ඉතා සමීප මිතුරන් හා ඥාතීන්ට ඉස්ලාමීය දූත මෙහෙවර රහසින් ලබා දුන්නේ ය. මෙහිදී කාන්තාවන් ගෙන් කදීජා (රළි) තුමිය ද, පිරිමින්ගෙන් අබූබක්කර් (රළි)තුමා ද, ළමයින්ගෙන් අලි (රළි) ඇතුළු පිරිසක් ද ප්‍රථමයෙන් ඉස්ලාමය වැළඳ ගත්හ. නුබුව්වත් ලැබූ ප්‍රථම තුන් වසර තුළ ප්‍රචාරය කළේ රහසිගතවය. අනතුරුව තම ප්‍රචාරය පුළුල් කළ නබි (සල්) තුමාණෝ සෆා කන්ද මත නැග ඉස්ලාමයේ පණිවුඩය ප්‍රසිද්ධියේ ඉදිරිපත් කළහ. එදින සිට අබූලහබ් ඇතුළු බොහෝ පිරිසක් නබි තුමාට එරෙහි වීමට පටන් ගත්හ. ''අස්සාදික්'' ''අල්අමීන්'' යනුවෙන් ප්‍රශංසා කළ නබිතුමා ව ශාස්ත්‍ර කියන්නා, සූනියම් කරන්නා, කවියා යනුවෙන් වස් කීහ. නබි (සල්) තුමා යන මාවතේ ගල්මුල් දැමූහ. හිස මතට කුණු හැලූහ. සලාතයේ යෙදී සිටින විට නබි තුමාගේ ඇඟට ඔටුවාගේ නරක් වූ බඩවැල් දැමූහ.

නබි (සල්) තුමාට පමණක් නොව ඉස්ලාමය වැළඳ ගත් සහාබාවරුන්ට ද වද හිංසා කළහ. ඉස්ලාමය අත්හරින ලෙස තර්ජනය කළහ. එනමුත් නබි (සල්) තුමා හා සහාබාවරුන් ඉස්ලාමය අත්හැරියේ නැත. මේ නිසා කෝපයට පත් මක්කා කුරෙයිෂිවරු නබිතුමා සහ එතුමා ගේ පවුලේ සාමාජිකයන් ෂිඃබු අබුතාලිබ් නම් වූ කඳු පාමුල රඳවා තැබූහ.

නබි (සල්) තුමාට සැමතින් ම සහායිකාව වු එතුමාගේ බිරිඳ කදීජා (රළි) තුමිය මරණයට පත් වුයේ මෙම කාල පරිච්ඡේදයේ දී ය. ඉන් පසු මසක් දෙකක් ගතවෙද්දී නබි (සල්) තුමාට ආරක්ෂාව ලබා දුන් අබූතාලිබ්තුමාත් මරණයට පත් විය. මෙනිසා නබි (සල්) තුමා අධික වශයෙන් කණගාටුවට පත් විය. මෙම වසර ''ආමුල් හුස්න්'' (ශෝකාන්විත වසර) නම් වේ.

අඛණ්ඩව තම ප්‍රචාරය දියත් කළ නබි (සල්) තුමාණෝ තායිෆ් නගරයට ගියහ. එහි ද ගල්වලින් ගසා වේදනාවට ලක් කෙරුණි. මෙලෙස විවිධ වු දුක් කම්කටොලු හා වේදනාවන්ට ලක් වු නබි (සල්) තුමාට මරණීය තර්ජන ද එල්ල කෙරුණි. අනතුරුව මක්කාවට හජ් ඉටු කිරීම පිණිස පැමිණෙන විදේශිකයන් හමුවේ ඉස්ලාමිය ප්‍රචාරය රහසිගතව පිරිනැමූහ.

මෙම යුගයේ යත්රිබ් වැසියෝ (මදීනා වැසියන්) සමහරෙක් ඉස්ලාමය වැළඳ ගත්හ. මොවුන්ගේ ඉල්ලීම හා අල්ලාහ්ගේ නියෝගය මත නබිතුමා හා සහාබා වරු මදීනාවට හිජ්රත් ගියහ. මෙම සිදුවීම නුබුව්වත් ලැබ් වසර 13 දී සිදු විය. එතැන් සිට නබිතුමාගේ මක්කා ජීවිතය අවසන් වී මදීනා ජීවිතය ආරම්භ විය.

**අභ්‍යාස**

'අ' කොටසට සුදුසු පිළිතුරු 'ආ' කොටසින් තෝරා අදාල අංකය වරහන තුළ ලියන්න.

(අ) 1. නබි (සල්) තුමාණන් ධ්‍යානයේ සිටි ස්ථානය ( )

2. නබි (සල්) තුමාට වහී රැගෙන ආ මලාඉකාවරයා ( )

3. ඉස්ලාමය වැළඳ ගත් ප්‍රථම කාන්තාව ( )

4. කදීජා (රළි) තුමිය ගේ ඥාතියෙකු හා පෙර ආගම් පිළිබඳ විශාරදයා ( )

5. නබි (සල්) තුමා ප්‍රසිද්ධියේ ඉස්ලාමය ප්‍රචාරය කළ ස්ථානය ( )

(ආ) 1. ජිබ්රීල් (අලෛ)

2. වරකත් බින් නව්ෆල්

3. සෆා

4. හිරා

5. කදීජා (රළි)